**විල්ගමුව ප්‍රාදේශීය සභාව - 2023**

**---------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

විල්ගමුව ප්‍රාදේශිය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට විල්ගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6 ඡේදයේ 1.6.1 හි (අ), (ආ), (ඇ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු.323,450 ක පුස්තකාල පොත් සහ රු.2,600,000 ක කැබ් රථයක් ගිණුම්ගත කර නොතිබුණි. | 2024 අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී අවස්ථා දෙකකදී ඉදිකිරීම් සඳහා වැයකළ රු.633,000 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | 2024 වර්ෂයේ වියදම් ලෙස දැක්විය යුතු එකතු වටිනාකම රු.216,925 ක් වන වියදම් ශේෂ 04 ක් සමාලෝචිත වර්ෂයේ උපචිත වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී වැය විෂයන් 02 ක් යටතේ රු.3,091,449 ක වැය කිරීම් ආදායම් වියදම් ගිණුමට රු.3,270,674 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු. රු.179,225 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී ගබඩා අත්තිකාරම් විවිධ ණයහිමියන් රු.296,750 ක් වුවද එය රු.514,555 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් රු.217,805 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කළ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම වත්කම් තුළ රු.1,817,316 ක කර්මාන්ත ණයගැතියන් බැර ශේෂයක් ලෙස හා ජංගම වගකීම් තුළ එකතුව රු.2,810,937 ක ණයහිමි හර ශේෂයක් ලෙස හා කර්මාන්ත තැන්පතු රු.67,596 ක් ජංගම වගකීම් තුළ හර ශේෂයක් ලෙසත් දෝෂ සහිතව දක්වා තිබුණි. | 2024 අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ පුර නැගුම ව්‍යාපෘතිය යටතේ රු.3,255,200 ක ජල උපකරණ කට්ටල 150 ක් සමාලෝචිත වර්ෂයේදි ලබා දී තිබුණද එය ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඌ) | ඉකුත් වර්ෂයේදී තොග ලැබීම් නිකුත් කිරීම්, තොග අත්තිකාරම් ගිණුමේ සටහන් කිරීමෙන් තොරව ප්‍රාග්ධන යෙදවුමට ආදායමින් දායක වීමේ ගිණුමේ සටහන් කිරීමෙන් එම ගිණුම රු.291,483 ක් වැඩියෙන් දක්වා තිබුණි | -එම- | -එම- |
| (එ) | ඉකුත් වර්ෂයේදී මිලදීගත් රු.1,645,788 ක විදුලි උපකරන තොගය ලී බඩු හා සවිකිරීම් යටතේ ගිණුම්ගත කිරීමේ වරද නිවැරදි කිරීමේදී එම වටිනාකම ප්‍රාග්ධන යෙදවුමට ආදායමින් දායකවීමේ ගිණුමට හර නොකිරිම හා පොදු ගබඩා ගිණුමට හර කිරීම හේතුවෙන් එම ගිණුම් දෙකම වැඩියෙන් දක්වා තිබුණි | -එම- | -එම- |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ගිණුම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවිමේ ගිණුම අතර රු4,713,366ක නොසැසදිමක් විය. | 2024 අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ගිණුම් විෂයයන් 18 ක ශේෂයන් සමඟ ඊට අදාල ලේඛන හා උපලේඛන සමඟ සැසදීමේදී රු.33,995,559ක නොසැසදීමක් නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොමැත | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |

### 1.6.3 අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දීර්ඝ කාලයක සිට පැවත එන වටිනාකම රු 1,501,545. ක අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | අවිනිශ්චිත ගිණුමේ ශේෂය හදුනාගෙන නිරවුල් කළ යුතුයි. |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන එකතුව රු.28,701,488 ක වත්කම් විෂයන් 06ක් හා රු.935,627 ක බැරකම් ශේෂ යකට අදාළ උපලේඛනඉදිරිපත් නොකිරිම , හේතුවෙන් සතුටුදායක ලෙසසත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | උපලේඛන හා ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | සභාවේ සේවයේ නොමැති වසර 23 ක කාලයක සිට අයවිය යුතු නිලධාරින් තිදෙනෙකුට අදාළ රු.79,624 ක ණය ශේෂ සම්බන්ධ තොරතුරු සභාව සතුව නොතිබුණි. | ණය ශේෂ කපාහැරීම සඳහා අනුමැතියට ඉදිරිපත් කර ඇති බව | ශේෂ නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුය |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** ගැසට් පත්‍ර | | | |
| 2022 ජනවාරි 27 දිනැති අංක 2264/18 දරන මධ්‍යම පරිසර අධිකාරි ගැසට් පත්‍රය | වලංගු කාල සීමාව ඉක්මවා ඇති ව්‍යාපාර ආයතන 06 ක පරිසර බලපත්‍ර අලුත්කර නොතිබුණි. | ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව. | ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | | |
| I. මු.රෙ.104(3) සහ (4) | වීථි ලාම්පු කට්ටල වලට අදාළ විදුලි උපාංග රු.126,700 ක් අස්ථානගතවීම හා රු.36,000 ක ආදාහනාගාර ආදායම ප්‍රාදේශීය සභා අරමුදලට බැර කර නොතිබීම සම්බන්ධයෙන් පරික්ෂණ මණ්ඩල පත්කර ඇතත් පරික්ෂණ සිදුකර නොතිබුණි. | අවසන් වාර්තාවේ නියෝග අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව. | මු.රෙ. ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| II. | 2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධනය වූ මු.රෙ.371 (2)(ආ) | අතුරු අග්‍රිමය අදාළ කාර්ය නිමකළ විගස පියවිය යුතු වුවද අවස්ථා 09 කදී ලබාගත් අග්‍රිමය මාස 01 සිට මාස 03 දක්වා කාල පරාසයක පියවීමේ ප්‍රමාදයක් පැවති අතර ඒ වන විට රු.67,785 ක මුදලක් අතරඳවාගෙන පැවතිණි. | මෙවැනි අඩුපාඩු සිදුනොවීමට වගබලාගන්නා බව. | මු.රෙ. ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**(ඇ) චක්‍රලේඛ**

| | | | | |
|---|---|---|---|---|
| I. | 2017 දෙසැම්බර් 21 දිනැති අංක 2/2017 දරන භාණ්ඩාගාර වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | ප්‍රාදේශිය සභාව සතු වාහන 02 ක් සභාව නමින් පවරා ගැනිමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමේ කටයුතු සිදුකරනු ලබන බව හා එක් වාහනයක් සම්බන්ධව අධිකරන කටයුත්තක් සිදුවන බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| II. | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | සභාව සතු ධාවන තත්ත්වයේ වාහන 04 ක වසර 01 ත් 07 ත් අතර කාලයක සිට ඉන්ධන දහනය පරික්ෂා කර නොතිබුණි. | ඉන්ධන දහන පරික්ෂාව සිදුකිරීමට කටයුතු කරන බව. | චක්රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,793,507 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,575,850 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් දිනට 31 මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් දිනට මුළු 31 හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i). වරිපනම් හා බදු | 2,470,000 | 2,424,965 | 2,323,668 | 889,525 | 680,000 | 709,688 | 1,151,420 | 788,227 |
| (ii). කුලී | 6,238,200 | 1,835,810 | 1,718,700 | 1,050,679 | 1,100,000 | 985,000 | 803,000 | 933,569 |
| (iii). බලපත්‍ර ගාස්තු | 1,121,000 | 856,789 | 856,789 | - | 1,000,000 | 879,845 | 1,557,760 | - |
| (iv). වෙනත් ආදායම් | 44,629,020 | 8,688,832 | 12,053,653 | 12,032,138 | 11,510,000 | 9,888,300 | 10,027,328 | 15,396,959 |
| එකතුව | 54,458,220 | 13,806,396 | 16,952,810 | 13,972,342 | 14,290,000 | 12,462,833 | 13,539,508 | 17,118,755 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) වෙනත් ආදායම්**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය තුළ ජල ගාස්තු රු 2,331,755.ක් බිල්කළ ද වර්ෂය තුළ රු 782,179.ක් හෙවත් බිල්කිරීමෙන් සියයට .මාණයක් අයකර තිබුණික් පමණ අඩු ප්‍ර 33 | අයකර ගැනිමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකර ගැනිමට කටයුතු කළ යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට සතිපොල හිඟ ආදායම රු3,.754,498 ක් වූ අතර ඉන් රු 3,623,345.ක් ඉකුත් වර්ෂ වලට අදාලව ලැබිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි | කපාහැරිමට අනුමැතියට යොමුකර ඇති බව. | නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුය. |

**(ආ) උසාව දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු1,136,418ක් විය. | අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව | හිඟ ආදායම් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභා බල ප්‍රදේශයේ ප්‍රචාරන දැන්වීම් පිළිබඳව සිදුකළ නියැදි පරීක්ෂණයට අනුව දැන්වීම් පුවරු ස්ථාන 04 ක වර්ග අඩි 320 ක් සඳහා වර්ග අඩියට රු.50 ක් බැගින් රු.16,000 ක මුදලක් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂයේදී අයකර ගැනීමට කටයුතු කරන බව | ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ස්ථාන මාරු වී ගිය නිලධාරින් 03 දෙනෙකුගෙන් අයවිය යුතු රු.664,474 ක ණය ශේෂය හා ස්ථාන මාරු වී පැමිණි අයෙකුගේ රු.237,039 ක ණය මුදල ගලපා විල්ගමුව කලාප අධ්‍යාපන කාර්යාලයෙන් සභාවට රු.427,435 ක චෙක්පතක් සමාලෝචිත වර්ෂයේ ඔක්තෝම්බර් 15 දින ලැබී ඇතත් ණය ශේෂ වලට හිලව් කිරිමකින් තොරව එය පොදු තැම්පතු තුළ රඳවාගෙන පැවතුණි. | අදහස් දක්වා නොමැත. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව පරිහරණය කරන ඉඩම් 54 ක අයිතිය සභාවට පවරාගැනිමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමේ කටයුතු සිදුකෙරෙමින් පවතින බව. | වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විල්ගමුව ප්‍රාදේශිය සභාවේ රු.10,620,344 ක ක්‍රියාකාරි තත්ත්වයේ පවතින වාහන 03 ක් වසර 03 ක කාලයක සිට භාවිතයට නොගෙන නිශ්කාර්යව පැවතුණි. | අලුත්වැඩියා කරන බව. | අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | විල්ගමුව ප්‍රාදේශිය සභාව සතු රු.785,000 ක වාහන 04 ක් වර්ෂ 03 සිට වර්ෂ 18 ක කාලයක් දක්වා ධාවන තත්ත්වයේ නොපැවතිම හා අළුත්වැඩියා කිරීමකින් තොරව විනාශ වීමට ඉඩහැර තිබුණි. | ලියාපදිංචි සහතිකය ලබාගැනීමටත් වෙන්දේසි කිරීම සඳහා කටයුතු කරන බව. | සුදුස්සක් කොට බැහැර කිරීමට කටයුතු කල යුතුය. |

## 3.4 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරය ආරම්භ කළ දින සිට විධිමත් ගෑස් දහන පරික්ෂාවක් සිදුකර නොතිබුණු අතර සමාන ආයතන වල මෘත දේහයක් ආදාහනය කිරිමට ගෑස් කිලෝග්‍රෑම් සභාවේ මෘත දේහය ක් වැය වුවද මෙම 12ක් ආදාහනය කිරිමට ගෑස් කිලෝග්‍රෑම් ක් 17.37 වැය කිරිම හේතුවෙන් පසුගිය වර්ෂ05 තුළ කිලෝග්‍රෑම් මාණයේ ගෑස් සිලින්ඩර්ප්‍ර 37.529 ක් හෙවත් ගෑස් කිලෝග්‍රෑම් 1092 ක් වැඩියෙන් භාවිතා කර හෝ අයථා පරිදි පරිහරනය කර හෝ තිබුණි ඒ අනුව . සමාලෝචිත වර්ෂයේ අවසානයට කිලෝග්‍රෑම් 37.5 ක ගෑස් සිලින්ඩරයක් පිරවීමට වැය කල රු.16,260 ක මිල අනුව රු.471,540 ක අලාභයක් සභා අරමුදලට සිදුවී තිබුණි . | ගැටලු නිරාකරණය සඳහා කටයුතු කරමින් පවතින බව. | විධිමත් පරික්ෂාවකින් පසු අලාභයක් වේනම් අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනිමට කටයුතු කල යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන සිට සභාවේ තනතුරු 09 ක පුරප්පාඩු 19 ක් පැවතුණි. | ඉහළ කළමනාකාරීත්වය දැනුවත් කර ඉල්ලීම් කර ඇති බව. | පුරප්පාඩු සම්පූර්ණ කරවාගත යුතුය. |

# 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත වරිපනම් හා බදු ආදායම රු.240,000 ක් වුවද, වර්ෂයට අදාළ බිල්කිරීම් රු.2,290,730 ක් වූයෙන් නිසි අවධානයකින් හා සැලකිල්ලකින් තොරව ඇස්තමේන්තු පිළියෙල කර තිබුණි. | මෙවැනි ආදායමක් ඉදිරි වර්ෂයේදී අපේක්ෂා කරන බව. | තාත්විකව අයවැය ලේඛන පිළියෙල කිරීමට කටයුතු කල යුතුය |

## 4.2 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 1980අංක 47 දරන ජාතික පරිසර පනතේ 2017 අගෝස්තු 30 දිනැති අංක LDB4/8 (XII) දරන සංශෝධනයට අනුව කිසිදු තැනැත්තෙකුට ප්ලාස්ටික් අඩංගු ද්‍රව්‍ය හෝ පහසුවෙන් දැවෙන වෙනත් ද්‍රව්‍ය එළිමහනේ පිළිස්සීමපිළිස්සීමට , ඉඩදීම හෝ අවසර දීම ,සැලැස්වීම නොකළ යුතු බව දන්වා තිබුණද | නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දේශයේදේශිය සහා බල ප්‍රප්‍රා පරික්ෂණයට භාජනය වූ ස්ථාන වල නොදිරන කසල පිළිස්සීම සිදුකර තිබුණි. | | |
| (ආ) | නාමිණී ඔය ආදායනාගාරයේ භාවිතයෙන් ඉවත් කරන ලද අබලි ද්‍රව්‍ය හා භාණ්ඩ විධිමත්ව ඉවත් කිරිමට කටයුතු නොකිරිම හේතුවෙන් ආදාහනාගාරය පරිශ්‍රය තුල එම ද්‍රව්‍ය ගොඩ ගසා පැවතුණි . | නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. | අපද්‍රව්‍ය බැහැර කිරීමට විධිමත් ක්‍රමවේදයක් සැකසිය යුතුය. |

## 4.3 තිරසර සංවර්ධන ඉලක්ක

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනතේ නියමයන්ට අනුව ප්‍රාදේශීය සභාව විසින් විධිමත් පරිදි තිරසර සංවර්ධන අරමුණු හදුනාගෙන ක්‍රියාත්මක කර නොතිබුණි. | ඉදිරියේදී වැඩසටහන් ක්‍රියාත්මක කිරිමට අපේක්ෂා කරන බව. | තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කල යුතුය. |